# අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධි මළුවේ බටහිර දොරටුව සමීපයේ වැලිමළුවේ පිහිටි ප්‍රාර්ථනා බෝධිය

ඩී.එම්.ටී. දිල්රුක්ෂි[1], එස්.වී.අයි.කේ. මදුවන්ති[2], ඒ.එල්.එස්.එස්. මධුමාලි[3]

අනුරාධපුර පූජා නගරයෙහි ජය ශ්‍රී මහා බෝධි මළුවේ බටහිර දොරටුව සමීපයේ වැලිමළුවේ පිහිටි ප්‍රාර්ථනා බෝධිය ලෙසින් හඳුන්වන, බෞද්ධයන්ගේ වන්දනා මානයට පාත්‍රවන සඳුන් වෘක්ෂයක් තිබේ. බොහෝ වන්දනාකරුවන් මෙම ප්‍රාර්ථනා බෝධිය වන්දනාමාන කරනු දැකගත හැකිය. මෙම ප්‍රාර්ථනා බෝධිය වන්දනාමාන කරන්නේ ඇයි ද යන්න සෙවීම අපගේ පර්යේෂණයේ ගැටළුව විය. මෙම පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය ලෙස අප ප්‍රාර්ථනා බෝධිය වන්දනා කරන බැතිමතුන්ගෙන් තෝරාගත් පිරිසකට ප්‍රශ්නාවලියක් ලබාදීම, ශ්‍රී මහා බෝධිය අභියස රාජකාරීභාර කපු මහත්වරුන් සමඟ සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ යන ක්‍රමවේදයන් යොදා ගන්නා ලදි. මෙම ප්‍රාර්ථනා බෝධිය සමීපයේ මින් පෙර තිබී ඇත්තේ නයි පෙනයක් කැටයම් කරන ලද ගලක් වන අතර බැතිමතුන් විසින් එය ප්‍රාර්ථනා ගල නමින් හඳුන්වා එයට වන්දනාමාන කර තමන්ගේ ප්‍රාර්ථනයන් සිදුකර ඇත. මෑත කාලයේ එම ගල විවිධ පාර්ශවයන්ගේ බලපෑමෙන් එම ස්ථානයෙන් ඉවත් කර ඇත. ප්‍රාර්ථනා ගල වන්දනාමාන කළ බැතිමතුන්ගේ කටවහරින් එය අනෙක් බැතිමතුන් අතර ව්‍යාප්ත වී ඇති අතර ප්‍රාර්ථනා ගල ඉවත් කිරීමෙන් පසු එම ස්ථානයේම පිහිටි සඳුන් වෘක්ෂයට බැතිමතුන් ප්‍රාර්ථනා ගස ලෙස හඳුන්වමින් වන්දනා කරනු ලැබේ. වයස් හා ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව බැතිමතුන්ගේ වන්දනාමානයට මෙම ප්‍රාර්ථනා බෝධිය පාත්‍ර වෙයි. අප තෝරාගත් නියැදියට අනුව 73% ක් බැතිමතුන් මෙම ප්‍රාර්ථනා බෝධිය කුමන වර්ගයට අයත් ශාකයක් දැයි යන්නවත් නොදැන වන්දනාමාන සිදුකරති. අපගේ පර්යේෂණයට අනුව සොයාගත හැකි වූයේ ශ්‍රී මහා බෝධිය පිහිටා තිබියදීත් ප්‍රාර්ථනා බෝධියට මිනිසුන් වන්දනාමාන සිදු කරන්නේ පාරම්පරිකව ඔවුන් හා බැඳී පැවති විශ්වාස නිසාත් කටවහරින් මේ පිළිබඳව දැනුවත් වීම නිසා බවය. එසේම තවත් පිරිසක් වෙනත් වන්දනාකරුවන් වන්දනා කරනු දැක වන්දනා කරන බවත් හඳුනාගත හැකිය. ජය ශ්‍රී මහා බෝධිය අභියස රාජකාරීභාර කපු මහත්වරුන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවන්ට අනුව පැහැදිලි වූයේ බැතිමතුන් ප්‍රාර්ථනා බෝධිය වන්දනාමාන කරනුයේ විභාග සමත්වීම්, විවාහ සාර්ථකවීම්, ලෙඩරෝග දුරුවීම්, දරුඵල අපේක්ෂාවන් වැනි අරමුණු සහිතව බවත් එම ප්‍රාර්ථනා ඉටුවීමෙන් පසු ශ්‍රී මහා බෝධිය අභියස එම භාර ඔප්පු දී නිදහස් කරන බවත්ය. ඒ අනුව අපගේ නිගමනය වන්නේ ප්‍රාර්ථනා බෝධිය ලෞකික අරමුණු පෙරදැරිව වන්දනාමාන කරන මහ බෝ මළුවේ ඇති පෞරාණික වෘක්ෂයක් බවය.

මුඛ්‍ය පද : ප්‍රාර්ථනා බෝධිය, සඳුන් වෘක්ෂය, බැතිමතුන්, ප්‍රාර්ථනා ගල, වන්දනාමාන

[1 2 3] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. thakshila.dilrukshi716@gmail.com